# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1973 ජනවාරි මස 13 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

(1973 ජනවාරි මස 26 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1973 ජනවාරි මස 13 වන දින]

එල්.ඩී.—ඕ. 89/71.

**නිවාසවල අයිතිය, විශාලත්වය සහ නිවාස තැනීමේ වියදම පාලනය කිරීම පිණිසත් ඊට ආනුෂංගික හෝ සම්බන්ධ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

## I වන කොටස

## නිවාසවල අයිතිය පාලනය කිරීම

2. (1) පවුලක සාමාජිකයකු වන පුද්ගලයකු සතුව තිබිය හැකි උපරිම නිවාස සංඛ්‍යාව, ඒ පවුලේ සෙසු සාමාජිකයන් සතුව ඇති නිවාස සංඛ්‍යාව ද සමග ගත් කල්හි, ඒ පවුලේ යැපෙන දරුවන් ඇත හොත් ඒ දරුවන්ගේ ගණනට දෙකක් එකතු කළ විට ලැබෙන ගණනට සමාන සංඛ්‍යාවක් විය යුතු ය. **අවසර ලත් නිවාස සංඛ්‍යාව.**

(2) පවුලක සාමාජිකයකු නොවන පුද්ගලයකු සතුව තිබිය හැකි උපරිම නිවාස සංඛ්‍යාව දෙකක් විය යුතු ය.

(3) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් සතුව තිබිය හැකි උපරිම නිවාස සංඛ්‍යාව, ඒ පුද්ගල මණ්ඩලයේ සේවකයන්ට සහ නිලධාරීන්ට නිවාස සැපයීමේ කාර්යය සඳහා හෝ ඒ පුද්ගල මණ්ඩලයේ (ගෙවල් කුලියට දීමේ යම් අරමුණක් නොවන) අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන නිවාස සංඛ්‍යාව විය යුතු ය :

එසේ වුව ද,—

(අ) සතුව තිබිය හැකි උපරිම නිවාස සංඛ්‍යාවට අදාළ ඉහත දැක්වුණු විධිවිධාන පළාත් පාලන ආයතනයකට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය සංස්ථාවකට අදාළ නො විය යුතු ය ; තව ද

(ආ) ප්‍රසිද්ධ සමාගමක් සතු වත්තක පිහිටියා වූ ද ඒ වත්තේ සේවකයකු පදිංචිව සිටින්නා වූ ද ගෙබිම් ප්‍රමාණය වර්ග අඩි පන්සියයකට නොවැඩි වූ ද නිවාසයක්, මේ පනතේ කාර්යයන් සඳහා ඒ සමාගමට අයත් නිවාස සංඛ්‍යාව නිශ්චය කිරීමේ දී ගණන් නොගත යුතු ය.

2—කේ 17803—13,064 (73/1)

(4) මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකු සතුව තබා ගත හැකි උපරිම නිවාස සංඛ්‍යාව මෙහි මින් මතු "අවසර ලත් නිවාස සංඛ්‍යාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(5) යම් පුද්ගලයකුට භාර්යාවක හෝ ස්වාමිපුරුෂයකු හෝ යැපෙන දරුවකු හෝ සිටිත් නම් නැතහොත් ඒ පුද්ගලයා යම් පුද්ගලයකුගේ යැපෙන දරුවකු නම් මේ පනතේ කාර්යයන් සඳහා ඒ පුද්ගලයා පවුලක සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථා වල දී නිවාස සංඛ්‍යාවක් නිශ්චය කිරීම.

3. 2 වන වගන්තියේ කාර්යයන් සඳහා නිවාස සංඛ්‍යාව නිශ්චය කිරීමේ දී—

(1) ආගමික සංවිධානයකට හෝ පුණ්‍ය භාරයකට හෝ අයත් නිවාසයක් නැතහොත් කාර්මික, වාණිජ හෝ කෘෂිකාර්මික ව්‍යාපාරයක කොටසක් වූ නිවාසයක් තනිකරම ඒ ආගමික සංවිධානයේ, පුණ්‍ය භාරයේ හෝ ව්‍යාපාරයේ කාර්යය සඳහා යොදවනු ලබන බව කොමසාරිස්වරයාගේ මතය වේ නම් සහ එසේ නම් පමණක් ඒ නිවාසය අත් හැරිය යුතු ය;

(2) මේ පනත ආරම්භ වන දිනයෙහි හෝ ඉන් පසු දිනයක, උරුමය නොපැවරූ මුදල් හිමිකමකින් නොව අන් ආකාරයකින්, නොබෙදූ කොටස්වලින් සමන්විත වන අයිතිය ඇති යම් නිවාසයක දෙකෙන් පංගුවකට නොඅඩු කොටසක අයිතිකරු වන තැනැත්තකුට ඒ නිවාසය අයිති ලෙස සලකනු ලැබිය යුතු ය;

(3) මේ පනත ආරම්භ වන දිනයෙහි හෝ ඉන් පසු දිනයක, උරුමය නොපැවරූ මුදල් හිමිකමකින් නොව අන් ආකාරයකින්, නොබෙදූ කොටස්වලින් සමන්විත වන අයිතිය ඇති එක් නිවාසයකට වැඩි නිවාස සංඛ්‍යාවක දෙකෙන් පංගුවකට අඩු කොටසක අයිතිකරු වන තැනැත්තකුට, එසේ ඔහුට හිමි කොටස් ඇති නිවාස සංඛ්‍යාව එකක් අඩුවෙන් අයිති ලෙස සලකනු ලැබිය යුතු ය;

(4) මේ පනත ආරම්භ වන දිනයට පෙර නොබෙදූ කොටස් වලින් සමන්විත වන අයිතිය ඇති නිවාසවල කොටස් අයිතිව සිටි තැනැත්තකුට, ආසන්නතම පූර්ණ සංඛ්‍යාවට ගණන් බලනු ලබන ඒ කොටස්වල එකතුවට සමාන නිවාස ගණනක් අයිති ලෙස සලකනු ලැබිය යුතු ය.

විකිණීම සඳහා නිවාස තනන තැනැත්තන්ට ඒ නිවාස අයිති ලෙස නොසැලකිය යුතු බව.

4. විකිණීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් නිවාසයක් තනනු ලබන අවස්ථාවක—

(අ) විකිණීමට පෙර ඒ නිවාසය පදිංචියට නොගන්නා ලද නම් සහ පදිංචිය සඳහා ඒ නිවාසය සූදානම් යයි කොමසාරිස්වරයා අදහස් කරන දිනයේ සිට මාස දොළහක් ඇතුළත හෝ ඒ තැනැත්තා විසින් කරන ලද ඉල්ලීමක් පිට තවත් මාස දොළහකට වැඩි නොවන කාලයකට කොමසාරිස්වරයා විසින් දීර්ඝ කර දෙනු ලැබිය හැකි කාල පරිච්ඡේදයක් ඇතුළත හෝ එය විකුණන ලද නම්: හෝ

(ආ) ඒ නිවාසය මිලට ගැනීම සඳහා වෙන යම් තැනැත්තකු විසින් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්නම් සහ ඒ ඉල්ලීම කර තිබෙන අතරතුර දී ඒ නිවාසය පදිංචියෙන් තොරව පවතී නම්

ඒ තැනැත්තා ඒ නිවාසය අයිතිව සිටින ලෙස මේ පනතේ කාර්ය යන් සඳහා සලකනු නොලැබිය යුතු ය.

නිවාස සංඛ්‍යාව අඩු කිරීම.

5. 1971 නොවැම්බර් මස 9 වන දින නිවාස සංඛ්‍යාවක් අයිතිව සිටි යම් තැනැත්තකු විසින් තමාට අයිති ඒ නිවාස සංඛ්‍යාව, සම් පූර්ණයෙන් විකිණීමෙන් හෝ තෑගි කිරීමෙන් හැර අන් ලෙසකින් ඒ දිනයෙන් පසුව සහ මේ පනත ආරම්භවීමට පෙර අඩු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ නිවාස සංඛ්‍යාව එසේ අඩු කිරීමට තමා විසින් පියවර ගන්නා ලද්දේ 1971 නොවැම්බර් මස 9 වන දිනට පෙර බවට හෝ ඒ නිවාස සංඛ්‍යාව අඩු කරන ලද්දේ තමාගේ පවුලේ සාමාජිකයින්ගේ පදිංචියට ඉඩකඩ සැලසීමේ කාර්යය සඳහා බවට ඒ තැනැත්තා කොමසාරිස්වරයා සෑහීමට පත් කළ හොත් මිස, 1971 නොවැම්බර් 9 වන දින ඔහුට අයිතිව තිබුණු නිවාස සංඛ්‍යාව ඔහුට අයිතිව තිබෙන ලෙස සලකනු ලැබිය යුතු ය.

නිවාස ඒකාබද්ධ කිරීම.

6. අවසර ලත් නිවාස සංඛ්‍යාව අයිතිව සිටින යම් තැනැත්තකු විසින් ඉන් නිවාස දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඒකාබද්ධ කිරීම සඳහා කොමසාරිස්වරයාගෙන් අවසරය ඉල්ලා සිටින අවස්ථා වක, ඒ තැනැත්තාගේ පවුලේ නිවාස අවශ්‍යතා සැලකිල්ලට ගත් විට ඒ ඒකාබද්ධ කිරීම යුක්ති සඟගත බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුව හොත් සහ ඉන් යම් නිවාසයක් කුලී නිවැසියකුට කුලියට දී නැතහොත් උචිත බලධරයාගේ එකඟත්වය ඇතිව කොම සාරිස්වරයා විසින් ඒ ඒකාබද්ධ කිරීමට අවසර දිය හැකි ය.

බදු ඉඩම්වල නිවාස.

7. යම් තැනැත්තකු විසින් තනන ලද නිවාසයක් ආණ්ඩුව විසින් හෝ වෙන යම් තැනැත්තකු විසින් ඔහුට බදු දුන් ඉඩමක තනා ඇත ද එය නො තකා මේ පනතේ කාර්යයන් සඳහා ඔහු ඒ නිවාසයේ අයිතිකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ නිවාස අයිතිකරුවන් විසින් කළ යුතු ප්‍රකාශනය සහ, ප්‍රකාශනය නො කළ හොත් හෝ නිවැරදි ප්‍රකාශන යක් නොකළ හොත් ඒ නිවාස කොමසාරිස් වරයා සතුවන බව.

8. (1) පවුලක සාමාජිකයකු නො වූ සහ මේ පනත ආරම්භ වන දිනයේ දී අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ නිවාස අයිතිව සිටින්නා වූ සෑම පුද්ගලයකු ම විසින් ඒ දිනයෙහි සිට සති දෙළහක් ඇතුළත දී ද, ඒ දිනයෙහි දී අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ නිවාස අයිතිව ඇත්තා වූ සෑම පුද්ගල මණ්ඩලයක් ම විසින්, ඒ පුද්ගල මණ්ඩලයට අයිතිව තබා ගත හැකි උපරිම නිවාස සංඛ්‍යාව පිළිබඳව අවස්ථාවෝචිත පරිදි කොමසාරිස්වරයා විසින් නැතහොත් සමාලෝචන මණ්ඩලය විසින් මේ පනත යටතේ කළ නිශ්චය ඒ පුද්ගල මණ්ඩලය වෙත දනුම් දෙනු ලැබූ දිනයෙහි සිට සති හයක් ඇතුළත දී ද—

(අ) ඒ පුද්ගලයාට හෝ පුද්ගල මණ්ඩලයට හෝ අයිති, නො බෙදූ කොටස්වලින් සමන්විත වන නිවාස ද ඇතුළු නිවාස සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කරමින් ;

(ආ) ඒ පුද්ගලයා හෝ පුද්ගල මණ්ඩලය හෝ අයිතිය තබා ගැනීමට අදහස් කරන නිවාස නිශ්චිතව සඳහන් කරමින් ; සහ

(ඇ) (අ) ඡේදයේ සඳහන් නිවාසවලට අදාළ විස්තර මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සපයමින්

කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් ප්‍රකාශනයක් යැවිය යුතු ය.

තව ද ඒ සමග ම, ඒ පුද්ගලයා හෝ පුද්ගල මණ්ඩලය හෝ අයිතිය තබා ගැනීමට අදහස් නොකරන යම් නිවාසයක කුලී නිවැසියකු වෙතොත් ඔහුට, තමන් ඒ නිවාසයේ අයිතිය තබා ගැනීමට අදහස් නොකරන බව, ඒ පුද්ගලයා හෝ පුද්ගල මණ්ඩලය හෝ විසින් ලිපියකින් දැනුම් දිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයෙහි යම් පවුලක සාමාජිකයින්ට අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ නිවාස අයිතිව තිබෙන අවස්ථාවක, ඒ පවුලේ ස්වාමිපුරුෂයා විසින් හෝ ස්වාමිපුරුෂයා ජීවත්ව නොසිටී නම් නැතහොත් ප්‍රකාශනයක් යැවීමට නීත්‍යනුකූලව ඔහුට හැකියාවක් නොමැති නම් ඒ පවුලේ භාර්යාව විසින් හෝ ඒ දිනයේ සිට සති දෙළහක් ඇතුළත දී—

(අ) ඒ පවුලේ එක් එක් සාමාජිකයාට අයිති, නොබෙදූ කොටස් වලින් සමන්විත වන නිවාස ද ඇතුළු නිවාස සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කරමින් ;

(ආ) ඒ පවුලේ සාමාජිකයින් අයිතිය තබා ගැනීමට අදහස් කරන නිවාස නිශ්චිතව සඳහන් කරමින් ; සහ

(ඇ) (අ) ඡේදයේ සඳහන් නිවාසවලට අදාළ විස්තර මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සපයමින්

කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් ප්‍රකාශනයක් යැවිය යුතු ය.

තව ද, ඒ සමග ම, ඒ පවුලේ එක් එක් සාමාජිකයාට අයත් වූ ද අයිතිය තබා ගැනීමට ඒ සාමාජිකයන් අදහස් නොකරන්නා වූ ද යම් නිවාසයක කුලී නිවැසියකු වෙතොත්, ඔහුට, ඒ නිවාසයේ අයිතිය තබා ගැනීමට අදහස් නොකරන බව, ඒ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව විසින් ලිපියකින් දැනුම් දිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශනය යවන තැනැත්තා අයිතිය තබා ගැනීමට අදහස් කරනු නොලබන යම් නිවාසයක අයිතිකරු නොවන අවස්ථාවක, ඒ නිවාසයේ අයිතිකරුගේ කැමැත්ත දක්වෙන ප්‍රකාශයක් ඒ ප්‍රකාශනය සමග විය යුතු ය. ඒ අයිතිකරු ඒ කැමැත්ත නොදෙන විට කොමසාරිස්වරයා විසින්, නිසි විභාගයකින් පසු, ඒ පවුලේ සාමාජිකයින් අයිතිය තබා ගත යුතු නිවාස නිශ්චය කළ යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ නැතහොත් (2) වන උපවගන්තියේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත දී ප්‍රකාශනය යැවීම යුක්ති සහගත හේතුවක් නොමැතිව පැහැර හැර ඇත්තා වූ හෝ අවස්ථාවෝචිත පරිදි තමාට නැතහොත් තම පවුලට අයිති නිවාස සංඛ්‍යාව සම්බන්ධයෙන් යම් සාවද්‍ය ප්‍රකාශයක් කර ඇත්තාවූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තාගේ පවුලේ යම් සාමාජිකයකුට අයිතිව ඇති, කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි එකී යම් නිවාසයක්, ඒ නිවේදනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයක සිට කොමසාරිස්වරයා වෙත සතු විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ කරන ලද යම් ප්‍රකාශනයක් ප්‍රකාර අයිතිය තබා ගැනීමට අදහස් නොකරන ලද යම් නිවාසයක් සහ, කොමසාරිස්වරයා විසින් (3) වන උපවගන්තිය යටතේ නිශ්චයක් කරන ලද අවස්ථාවක දී ඒ නිශ්චය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අයිතිය තබාගනු නොලැබූ යම් නිවාසයක්, මෙහි මින් මතු " වැඩිපුර නිවාසයක් " යනුවෙන් සඳහන් කරනු ලැබේ.

9. වැඩිපුර නිවාසයක කුලී නිවැසියා විසින් හෝ ඒ නිවාසයේ නිවාස බද්දට 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 36 වන වගන්තිය යටතේ අනුප්‍රාප්ත වන යම් තැනැත්තකු විසින් මේ පනත ආරම්භ වන දිනයේ සිට මාස හතරක් ඇතුළත දී ඒ වැඩිපුර නිවාසය මිලට ගැනීම සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

වැඩිපුර නිවාස මිලට ගැනීමට කුලී නිවැසියන් විසින් ඉල්ලුම්කළ හැකි බව.

10. මේ පනත ආරම්භ වන දිනයෙහි යම් තැනැත්තකුට අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ යම් නිවාසයක් අයිතිව තිබෙන අවස්ථාවක, ඒ නිවාසයේ කුලී නිවැසියා විසින් හෝ 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 36 වන වගන්තිය යටතේ ඒ නිවාසයේ නිවාස බද්දට අනුප්‍රාප්ත වන යම් තැනැත්තකු විසින් ඒ නිවාසය මිලට ගැනීම සඳහා, අයිතිකරුට ද එකවර දැනුම් දෙමින් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත හොත් මිස ඉහත කී දිනයෙහි සිට මාස දෙළහක කාලපරිච්ඡේදයක් ඇතුළත දී ඒ අයිතිකරු විසින් කොමසාරිස්වරයාට දැනුම් දී ඒ නිවාසය විකිණිය හැකි ය.

අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ නිවාස මාස දෙළහක් ඇතුළත විකිණිය හැකි බව.

11. (1) මේ පනත ආරම්භ වන දිනයෙහි සිට මාස දෙළහක කාලපරිච්ඡේදයක් ඇතුළත විකුණනු නොලැබූ, යම් තැනැත්තකුට අයිති, අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ යම් නිවාසයක් එම කාලපරිච්ඡේදය අවසානයේ දී කොමසාරිස්වරයා වෙත සතු විය යුතු ය :

අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූනිවාස කොමසාරිස් වරයා වෙත සතු වන බව.

එසේ වුවද නිවාසයේ අයිතිකරු විසින් තමා වෙත කරන ලද ඉල්ලීමක් සලකා බලා, නිවාසය විකිණීමට නොහැකි වීම නිවාසයේ අයිතිකරුට වැළැක්විය නොහැකි හේතු නිසා සිදු වූ බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක ගැසට් පත්‍රයේ පළ

කරනු ලබන නිවේදනයක් මගින් කොමසාරිස්වරයා විසින් මාස දොළහකට නොවැඩි තවත් කාලපරිච්ඡේදයකට නිවාසය සතු කිරීම කල් දමනු ලැබිය හැකි ය.

(2) මේ පනත ආරම්භ වන දිනයෙන් පසු යම් දිනයක යම් තැනැත්තකු අවසරලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ යම් නිවාස යක අයිතිකරු බවට පත් වූ අවස්ථාවක, ඔහු විසින් නොපමාව ඒ බව කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු අතර, අයිතිය තබා ගැනීමට තමා අදහස් නොකරන නිවාසය කවරේදැයි නිශ්චය වශයෙන් සඳහන් කළ යුතුය. කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් නිශ්චය කරනු ලැබිය හැකි දිනයක සිට ඒ නිවාසය කොමසාරිස්වරයා වෙත සතු විය යුතු ය.

(3) මේ පනත ආරම්භ වන දිනයෙන් පසු යම් දිනයක දී එදිනට ඇති අවසර ලත් නිවාස සංඛ්‍යාවට වැඩියෙන් වූ යම් නිවාසයක් අයිතිව සිටීමට යම් තැනැත්තකුට හිමිකම ලැබෙන අවස්ථාවක, ඔහු විසින් ඒ බව කොමසාරිස්වරයා වෙත නිවේදනය කළ යුතු ය. එවිට, ඔහුට අයත්ව තිබුණා වූ ද මේ පනතේ විධිවිධාන යටතේ කොමසාරිස්වරයා සතු වූ ද යම් නිවාසයක් ඒ නිවේදනය කරනු ලැබූ අවස්ථාවේ දී ඒ සතු කිරීම යටතේ එසේ ම පවතිත හොත් කොමසාරිස්වරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නිවාසයේ තමාගේ අයිතිය අත්හැරිය හැකි ය. තව ද ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට ඒ නිවාසය කිසි විටකත් කොමසාරිස්වරයා සතුව නොතිබුණු ලෙස සලකනු ලැබිය යුතු ය.

**කොමසාරිස් වරයා වෙත සතුවූ නිවාස.**

12. (1) මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු වූ යම් නිවාසයක් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසිවලට සහ නියමයන්ට යටත්ව යම් පළාත් පාලන ආයතනයකට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය සංස්ථාවකට කොමසාරිස්වරයා විසින් පවරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු වූ යම් නිවාසයක් විකිණීමට කොමසාරිස්වරයා අදහස් කරත හොත් ඒ නිවාසය විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර ඒ නිවාසයේ කුලී නිවැසියකු සිටිත හොත් පළමු කොට ඔහුට එය එසේ ඉදිරිපත් කළ යුතු ය.

**ඇතැම් නිවාස මිලට ගැනීමට කුලී නිවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම.**

13. යම් කුලී නිවැසියකුට කුලියට දී ඇති නිවාසයක් මිලට ගැනීම සඳහා ඒ කුලී නිවැසියා විසින් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි නමුදු ඒ නිවාසයේ ගෙහිමියාගේ හෝ ඔහුගේ පවුලේ යම් කෙනකුගේ පදිංචිය පිණිස වාසස්ථානයක් වශයෙන් ඒ සඳහා යුක්ති සහගත ලෙස අවශ්‍යව තිබීමේ හේතුව මත එහි කුලී නිවැසියා ඉවත් කිරීම සඳහා 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත යටතේ නඩුවක් හෝ නීති කෘත්‍යයක් පැවරිය නොහැකි විට පමණක් එසේ කළ හැකි විය යුතු ය :

එසේ වුව ද, ඉදිරිපත් කරන ලද ඉල්ලීම, 14(1) වන වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි නිවාසයක් මිලට ගැනීම සඳහා වූ විටක දී, ඒ නිවාසයේ අයිතිකරු ඒ නිවාසය විකිණීමට කැමැත්තේ නම් මිස, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් කිසිවක් නොකළ යුතු ය. තව ද එකී කැමැත්ත දීම අවසර ලත් නිවාස සංඛ්‍යාව අතුරින් එක් නිවාසයක් සම්බන්ධයෙන් පමණක් මේ පනත යටතේ අත්හිටුවිය හැකි ය.

මේ වගන්තියේ සහ 12 වන වගන්තියේ කාර්යයන් සඳහා "කුලී නිවැසියා" යන්නට 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තිය යටතේ නිවාසයක සන්තකය භාර දීම සඳහා සිය වාසියට කරන ලද ආඥාවක් ලැබ සිටින කුලී නිවැසියෙක් ද ඇතුළත් වේ.

අයිතිකරුවන් විසින් ඇතැම් නිවාස කොමසාරිස්වරයාට විකිණීම.

**14.** (1) යම් තැනැත්තකු විසින් තමාට අයිති යම් නිවාසයක් කොමසාරිස්වරයාට විකිණීම සඳහා වූ ඉල්ලීමක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ හැකි නමුදු—

(අ) ඒ නිවාසය කුලී නිවැසියකුට කුලියට දී තිබේ නම් සහ එය අවසර ලත් නිවාස සංඛ්‍යාවට ඇතුළත් නම්;

(ආ) ඒ නිවාසයේ මාසික සම්මත ගෙවල් කුලිය රුපියල් එක් සීයයකට වැඩි නොවේ නම්;

(ඇ) තෑගීමෙන් හෝ මිලට ගැනීමෙන් හෝ, නියමිත දිනයට පෙර නිවාසයේ අයිතිය ලබා සිටි මවගෙන් හෝ පියාගෙන් හෝ ස්වාමිපුරුෂයාගෙන් හෝ භාර්යාවගෙන් හෝ තෑගි වශයෙන් හෝ උරුම වීමෙන් හෝ නියමිත දිනයට පෙර ඒ තැනැත්තා විසින් ඒ නිවාසයේ අයිතිය ලබා තිබේ නම්; සහ

(ඈ) තමාගේ හෝ තම පවුලේ සාමාජිකයකුගේ හෝ පදිංචිය පිණිස වාසස්ථානයක් වශයෙන් යුක්ති සහගත ලෙස අවශ්‍යව තිබීමේ හේතුව මත වෙන යම් නිවාසයක කුලී නිවැසියා එයින් ඉවත් කිරීම සඳහා 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත යටතේ නඩුවක් හෝ නීති කෘත්‍යයක් පැවරීමට ඒ තැනැත්තාට හිමිකම් නැතහොත්

පමණක් එසේ කළ හැකි විය යුතු ය.

මේ උපවගන්තියෙහි "නියමිත දිනය" යන්නෙන් තත් කාලයේ නිවාසයේ කුලී නිවැසියා නැතහොත්, තත් කාලයෙහි කුලී නිවැසියා 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 36 වන වගන්තිය යටතේ හෝ (274 වන අධිකාරය වූ) ගෙවල් කුලී පාලන පනතේ 18 වන වගන්තිය යටතේ හෝ නිවාස බද්දට අනුප්‍රාප්ත වූයේ යම් කුලී නිවැසියකු මියගිය විට ද ඒ කුලී නිවැසියා නිවාසයේ පදිංචියට පැමිණි දිනය අදහස් වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, අවසර ලත් නිවාස සංඛ්‍යාව අතුරින් එක් නිවාසයකට වැඩි ගණනක් මේ පනත යටතේ කොමසාරිස්වරයාට

විකිණීමට කිසිදු තැනැත්තකුට හිමිකම නොමැත්තේ ය. එහෙත්, ඊට අතිරේක යම් නිවාසයක් විකිණීම සඳහා (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විට, ඒ නිවාසය සඳහා කොමසාරිස්වරයා විසින් ගෙවනු ලබන මිලට ඒ නිවාසය එහි කුලී නිවැසියා විසින් මිලට ගනු ලබන බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුව හොත්, එම හිමිකම ඇත.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්තා වූ ද, ඒ නිවාසය විකිණීමෙන් ලැබෙන මුදල් නිවාසයක් තැනීම හෝ මිලට ගැනීම හෝ සඳහා යෙදවිය යුතු වීමේ කොන්දේසිය ද ඇතුළුව කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව එය විකිණීමට ඉල්ලුම්කරු කැමැත්තෙන් සිටින්නා වූ ද අවස්ථාවක කොමසාරිස්වරයා විසින් අමාත්‍යවරයා වෙත ඒ බව නිවේදනය කළ යුතු ය. එවිට අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් දිනයක සිට ඒ නිවාසය කොමසාරිස්වරයා වෙත සතු කළ හැකි ය.

(4) යම් නිවාසයක් සම්බන්ධයෙන් 13 වන වගන්තිය සහ මේ වගන්තිය යන දෙකම යටතේ ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, 13 වන වගන්තිය යටතේ වූ ඉල්ලීම සම්බන්ධයෙන් ක්‍රියා නොකළ යුතු අතර ඒ නිවාසය සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ පමණක් ඉල්ලීමක් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

**සතුවීමේ දිනය සහ සතු වූ නිවාසවල හිමිකම.**

15. (1) යම් නිවාසයක් කොමසාරිස්වරයා වෙත සතු වන්නා වූ දිනය වශයෙන් කොමසාරිස්වරයා විසින් හෝ අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ දිනයට පෙර, අවස්ථාවෝචිත පරිදි කොමසාරිස්වරයා විසින් හෝ අමාත්‍යවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් හෝ නියමයකින්, ඒ නිවාසය කොමසාරිස්වරයා වෙත එසේ සතු විය යුතු දිනය කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත නිවාසයක් සතු වූ විට සියලු බැඳීම්වලින් තොරව ඒ නිවාසය පිළිබඳ පරම අයිතිය කොමසාරිස්වරයාට තිබිය යුතු අතර ඒ නිවාසයට හෝ ඒ නිවාසය පිළිබඳ කවර වූ හෝ අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් ඇත්තා වූ හෝ ඇතැයි කියන්නා වූ කවර වූ හෝ සියලු තැනැත්තන්ට ප්‍රතිපක්ෂව සියලු කාර්යයන් සඳහා ඒ සතු කිරීම අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය :

එසේ වුව ද—

(අ) ඒ නිවාසයේ අයිතිකරු විසින් ඒ නිවාසය පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට ඒ නිවාසය සම්බන්ධයෙන් ගෙවිය යුතු වරිපණම් හෝ බදු කිසිවක් වේ නම් එය අය කර ගැනීම සඳහා, ඒ නිවාසයේ මිල වශයෙන් ඒ නිවාසයේ අයිතිකරුට ගෙවිය යුතු මුදල විෂයෙහි කැප අයිතියක් ඒ පළාත් පාලන ආයතනයට තිබිය යුතු ය; තව ද

(ආ) සතු කෙරෙන අවස්ථාවේ දී ඒ නිවාසය උකසකට යටත්ව තිබුණේ නම් උකස් හිමියාට ලැබිය යුතු යම් මුදලක් අය කර ගැනීම සඳහා (අ) ඡේදයෙහි සඳහන් මුදල විෂයෙහි කැප අයිතියක් ඒ උකස් හිමියාට තිබිය යුතු ය.

**16.** (1) තට්ටු නිවාසයක් හෝ ගෙපතක් හෝ නොවන යම් නිවාසයක් මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු වූ අවස්ථාවක, කොමසාරිස්වරයාගේ මතය අනුව ඒ නිවාසයට අනුබද්ධ ලෙස යුක්ති සහගතව සැලකෙන ඉඩම් ප්‍රමාණය ද කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබිය යුතු ය.

**අනුබද්ධ ඉඩම සතු කිරීම.**

(2) යම් තට්ටු නිවාසයක් මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු වූ අවස්ථාවක ඒ තට්ටු නිවාසයට අනුබද්ධ ඉඩම සහ වෙනත් අයිතිවාසිකම් ද කොමසාරිස්වරයා වෙත සතු විය යුතු ය.

(3) යම් ගෙපතක් මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු වූ අවස්ථාවක, කොමසාරිස්වරයාගේ මතය අනුව ඒ ගෙපතට අනුබද්ධ යයි සැලකෙන ඉඩම් ප්‍රමාණය සහ අයිතිවාසිකම් ද කොමසාරිස්වරයා වෙත සතු විය යුතු ය.

**17.** (1) නිවාසයක් මිලට ගැනීම සඳහා මේ පනත යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්තා වූ ද—

**නිවාස මිලට ගැනීම සඳහා ඉල්ලීම.**

(අ) කොමසාරිස්වරයාගේ මතය අනුව, මුඩුක්කු සංහාරය, සංවර්ධනය හෝ ප්‍රතිසංවර්ධනය හෝ වෙන යම් පොදු කාර්යයක් හෝ සඳහා අවශ්‍ය නොවන ප්‍රදේශයක ඒ නිවාසය පිහිටා ඇති බවට;

(ආ) ඒ නිවාසය වෙන ම ඒකකයක් වශයෙන් අන් සතු කිරීම කළ හැකි බවට; සහ

(ඇ) ඒ මිලට ගැනීම කළ හැකි තත්ත්වයක ඒ ඉල්ලුම්කරු සිටින බවට

කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නා වූ ද අවස්ථාවක, ඒ බව කොමසාරිස්වරයා විසින් නිවේදනය කරනු ලැබූ කල්හි අමාත්‍ය වරයා විසින් (මෙහි මින් මතු "සතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයක සිට ඒ නිවාසය කොමසාරිස් වරයා වෙත සතු කරනු ලැබිය හැකි ය.

(2) යම් නිවාසයක් (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් වරයා වෙත සතු කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින්, පහත සඳහන් කොන්දේසිවලට සහ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් කොන්දේසිවලට යටත් ව ඒ නිවාසය ඒ ඉල්ලුම්කරුට විකිණීම සඳහා කොමසාරිස්වරයා ඒ ඉල්ලුම්කරු සමග ගිවිසුමකට එළඹිය යුතු ය:—

(අ) ඒ නිවාසය සඳහා එහි කලින් අයිතිකරුට ගෙවිය යුතු මිල වශයෙන් මේ පනත යටතේ නිශ්චය කරනු ලැබූ මුදල් ප්‍රමාණය ද කොමසාරිස්වරයා විසින් දරනු ලබන වියදම් පියවීම පිණිස ඒ මුදල් ප්‍රමාණයෙන් සියයට පහක අමතර

මුදලක් ද එකවරම හෝ කුලියට ගිවිසුන් වීමේ ක්‍රමයට හෝ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වාරිකවලින් හෝ ඉල්ලුම්කරු විසින් කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය ;

(ආ) ඒ නිවාසයේ මිල වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය අවසාන වශයෙන් නිශ්චය කරනු ලබන තුරු ඒ නිවාසය සඳහා ගෙවිය යුතු මාසික ගෙවල් කුලියට නො අඩු මුදලක් ඉල්ලුම්කරු විසින් කොමසාරිස්වරයාට මාසේ පතා ගෙවිය යුතු ය. ඒ ගෙවීම ඒ නිවාසයේ මිල වශයෙන් ගෙවිය යුතු මුදලෙන් හිලව් කරනු ලැබිය යුතු ය ;

(ඇ) ඒ නිවාසය අලුත්වැඩියා කිරීම සහ මනා ලෙස පවත්වාගෙන යෑම ඉල්ලුම්කරුගේ වගකීම විය යුතු අතර, ගින්නෙන් හෝ මහජන කැළඹීම් සහ කැරලි කෝලාහලවලින් සිදු වන හානි හෝ අලාභ වෙනුවෙන් ඉල්ලුම්කරු විසින් නිවාසය රක්ෂණය කළ යුතු ය. තවද යම් පළාත් පාලන ආයතනයකට ගෙවිය යුතු සියලු වරිපනම් සහ බදු ඔහු විසින් ගෙවිය යුතු ය.

(3) ඉහත සඳහන් කොන්දේසි අතුරින් යම් කොන්දේසියක් අනුව ක්‍රියා කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වුවහොත් ගිවිසුම ශූන්‍ය සහ බල රහිත වූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඉල්ලීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් දරනු ලැබ තිබිය හැකි වියදම් ඉල්ලුම්කරු විසින් කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය.

(4) 12 වන වගන්තිය යටතේ කරනු ලැබූ ඉදිරිපත් කිරීම පිළිගත් කුලී නිවැසියකුට නිවාසයක් විකුණනු ලැබීමේ දී ද මේ පනත යටතේ තමා වෙත සතු වූ යම් නිවාසයක් වෙන යම් තැනැත්තකුට විකිණීමට කොමසාරිස්වරයා අදහස් කරන විට ද (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**කොමසාරිස් වරයා සතු වූ නිවාසයක සන්තකය භාර ගැනීම.**

18. (1) තමා වෙත සතු වූ යම් නිවාසයක සන්තකය භාර ගැනීම, සංවර්ධන කටයුතු හෝ අන් කාර්යයක් සඳහා අවශ්‍ය බව කොමසාරිස්වරයා අදහස් කරන අවස්ථාවක, එසේ භාර ගැනීමට කොමසාරිස්වරයා විසින් විශේෂයෙන් හෝ පොදුවේ බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ඒ නිවාසයේ සන්තකය භාර ගත හැකි ය.

(2) කිසිම තැනැත්තකු විසින්, සන්තකය භාර ගැනීමට අදහස් කරන බවට යටත් පිරිසෙයින් දින හතකවත් කල්දීමක් පදිංචිකරුට නොකර, පදිංචිය ඇති ගොඩනැගිල්ලක හෝ එවැනි ගොඩනැගිල්ලක යම් කොටසක සන්තකය (1) වන උපවගන්තිය යටතේ භාර නොගත යුතු ය.

(3) කොමසාරිස්වරයා වෙත සතු වූ සෑම නිවාසයක් ම සම්බන්ධයෙන්, එය පවතින තත්ත්වය සහ එහි කළ යුතු අලුත්වැඩියා කිරීම් පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීම හෝ පිළියෙල කිරීමට සැලැස්වීම කොමසාරිස්වරයා විසින් කළ යුතු ය.

19. (1) කොමසාරිස්වරයා සඳහා සහ වෙනුවෙන් 18 වන වගන්තිය යටතේ යම් නිවාසයක සන්තකය භාරගැනීමෙන් හෝ භාර ගැනීමෙහි ලා යම් තැනැත්තකු—

(අ) වළක්වන, ඔහුට බාධා කරන හෝ විරෝධය දක්වන ; හෝ

(ආ) යම් කෙනකු ලවා නියමින් හෝ අනියමින් වළක්වන, ඔහුට බාධා කරවන හෝ විරෝධය දක්වන

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

කොමසාරිස්වරයා සඳහා සහ වෙනුවෙන් නිවාසයක සන්තකය භාර ගැනීම වැළැක්වීම හෝ ඊට බාධා කිරීම.

(2) කොමසාරිස්වරයා සඳහා සහ වෙනුවෙන් යම් නිවාසයක සන්තකය භාර ගැනීමට කොමසාරිස්වරයා විසින් 18 වන වගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තකු වෙත දක්වා ඇති හෝ දැක්විය හැකි යයි සිතිය හැකි යම් බාධාවක් හෝ විරෝධයක් නිසා ඒ නිවාසයෙහි සන්තකය භාර ගැනීමට ඔහු අපොහොසත් වන හෝ එහි ලා තමා අපොහොසත් විය හැකි යයි ඔහුට සිතෙන අවස්ථාවක, ඒ නිවාසය පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒ තැනැත්තා විසින් ඒ වෙනුවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කළ විට කොමසාරිස්වරයා සඳහා සහ වෙනුවෙන් ඒ නිවාසයේ සන්තකය ඒ තැනැත්තාට භාර දෙන ලෙස පිස්කල්ට විධාන කරමින් මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ අධිකරණයේ ආඥාවක් නිකුත් කළ යුතු ය.

(3) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පිස්කල් වෙත (2) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ඒ ආඥාව වහාම ක්‍රියාත්මක කළ යුතු අතර ඒ ආඥාව ක්‍රියාත්මක කරනු ලැබූ ආකාරය ඒ අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කළ යුතු ය.

(4) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පිස්කල් වෙත (2) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඒ ආඥාව ප්‍රශ්න කිරීමේ, වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ අදහසින් යම් අධිකරණයක ගනු ලැබූ හෝ ආරම්භ කිරීමට අදහස් කර ඇති යම් පියවරක් හේතුකොට ගෙන, කිසිම ආකාරයකින්, ඒ ආඥාව ක්‍රියාත්මක කිරීම නතර නොකළ යුතු ය.

(5) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පිස්කල් හෝ ඔහුගේ මෙහෙයවීම යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින්, ඒ ආඥාව අදාළ වන නිවාසයට ඇතුළු වී එහි පදිංචි යම් තැනැත්තකු ඉන් ඉවත් කිරීමටත් ඒ නිවාසයෙහි සන්තකය භාර ගැනීමට 18 වන වගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තාට කොමසාරිස්වරයා සඳහා සහ වෙනුවෙන් ඒ නිවාසයේ සන්තකය භාර දීමටත් අවශ්‍ය විය හැකි යම් බලයක් පාවිච්චි කළ හැකි ය.

20. යම් නිවාසයක් කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ අවස්ථාවක කොමසාරිස්වරයා විසින්, ගැසට් පත්‍රයෙහි සහ ඔහු විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයකින් පළ කරනු ලබන දැන්වීමක් මගින්, එම නිවාසය සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු වන මුළු මිල ම හෝ ඉන් යම් කොටසක්

සතු කළ නිවාසයක් වෙනුවෙන් ගෙවිය යුතු වන මිලට හිමිකම් පෑමට අයිතිය ඇති තැනැත්තන් වෙත දැන්වීම.

සඳහා එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයෙහි සිට ගණන් බලනු ලබන මාසයක කාල පරිච්ඡේදයක් ඇතුළත ලිඛිත හිමිකම් පෑමක් ඉදිරිපත් කරන ලෙස ද ඒ හිමිකම් පෑමෙහි—

(අ) ඔහුගේ නම සහ ලිපිනය,

(ආ) එම නිවාසය පිළිබඳ වූ ඔහුගේ සම්බන්ධතාවෙහි ස්වභාවය,

(ඇ) ඔහුගේ හිමිකම් පෑමේ විස්තර, සහ

(ඈ) එම මිලෙන් ඔහු හිමිකම් පාන ප්‍රමාණය

යන මේවා නිශ්චිතව සඳහන් කරන ලෙස ද එම නිවාසය එසේ සතු කරනු ලැබූ දිනයට පෙරාතුව ම එම නිවාසය පිළිබඳ යම් සම්බන්ධතාවක් දැරූ සෑම තැනැත්තෑුට ම විධාන කළ යුතු ය.

හිමිකම් පෑම ලැබුණු විට කොමසාරිස්වරයා විසින් අනුගමනය කළ යුතු විධිවිධාන.

21. (1) 20 වන වගන්තිය යටතේ කරන ලද යම් හිමිකම් පෑමක් ලැබුණු විට, කොමසාරිස්වරයා විසින්, ඒ නිවාසය සඳහා ගෙවීමට තමා අදහස් කරන මිල හිමිකම් පාන්නාට දැනුම් දී, තමා නිශ්චිතව සඳහන් කරන කාලය ඇතුළත—

(i) ගෙවීමට අදහස් කරන මිලට ඔහු එකඟ වන්නේ ද නැද්ද යන වගත් එසේ එකඟ නොවන්නේ නම් ඒ මිලට විරුද්ධව ඔහුට තිබිය හැකි විරෝධතා කිසිවක් වේ නම් ඒ විරෝධතාත් ඒ විරෝධතාවලට හේතුත් සඳහන් කරමින් ලිඛිත ප්‍රකාශයක් තමා වෙත එවන ලෙස ; සහ

(ii) ඒ යම් විරෝධතාවක් සනාථ කිරීමට ඔහු පිහිට පතා සිටින සියලු ලේඛන තමා වෙත ඉදිරිපත් කරන ලෙස

ඔහුට නියම කළ යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් ගෙවීමට අදහස් කරන ලද මිලට හිමිකම් කියා පාන්නා එකඟ වුව හොත් මේ පනතේ විධිවිධාන වලට අනුකූලව ඒ මිල කොමසාරිස්වරයා විසින් ගෙවිය යුතු ය.

ගෙවිය යුතු මිල පිළිබඳ තීන්දුවක් සඳහා මණ්ඩලය වෙත යොමු කිරීම.

22. (1) කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ (ගෙවීමට අදහස් කරන ලද මිල පිළිගැනීමට හිමිකම් පාන්නා 21 වන වගන්තිය යටතේ එකඟ වූ නිවාසයක් නොවන) සෑම නිවාසයක්ම වෙනුවෙන් ගෙවිය යුතු මිල නිශ්චය කිරීමේ කාර්යය කොමසාරිස්වරයා විසින් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාලෝචන මණ්ඩලය වෙත යොමු කළ යුතු අතර ඒ මිල සඳහා කරනු ලැබූ සියලු හිමිකම් පෑම් ද, ඒවා සනාථ කිරීමට හිමිකම් පාන්නන් විසින් සපයන ලද සියලු ලේඛන සමග, මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත කරනු ලබන යොමු කිරීමක් මේ පනතෙහි මින් මතු "මිල තීන්දුවක් සඳහා යොමු කිරීමක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

ගෙවිය යුතු මිල නිශ්චය කිරීම.

23. මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක් සඳහා ගෙවිය යුතු මිල—

(අ) කුලී නිවැසියකුට කුලියට දෙන ලද නිවාසයක් සම්බන්ධයෙන් වූ විට ඒ නිවාසයේ සන්තකය ආපසු ලබා ගත හැක්කේ 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ විධිවිධානවලට

අනුකූලව සහ කුලී නිවැසියා විසින් හෝ, 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 36 වන වගන්තිය හෝ (274 වන අධිකාරයවූ) ගෙවල් කුලී පාලන පනතේ 18 වන වගන්තිය හෝ යටතේ කුලී නිවැසියා ඒ නිවාසයේ නිවාස බද්දට අනුප්‍රාප්ත වූයේ යම් තැනැත්තකු මිය ගිය විට ද ඒ තැනැත්තා විසින් කරන ලද එකතුකිරීම් හෝ වැඩි දියුණු කිරීම් කිසිවක් වේ නම් ඒවායේ වටිනාකම සැලකිල්ලට නොගෙනය යන පදනම මත නිශ්චය කළ යුතු, නිවාසය සතු කිරීමේ දිනයේ දී පැවැති එහි වෙළෙඳ අගය ; හෝ

(ආ) මිලට ගැනීමෙන් හෝ අන් ලෙසකින් 1957 අප්‍රේල් මස 1 වන දිනට පෙර හෝ මිලට ගැනීමෙන් නොව අන් ලෙස කින් 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව නිවාස යේ අයිතිය ලබා ඇති විට, ඒ නිවාසය සතු කිරීමේ දිනය දක්වා වූ එක් එක් වර්ෂය සඳහා 1957 අප්‍රේල් මස 1 වන දින පැවති ඒ නිවාසයේ වෙළෙඳ අගයෙන් සියයට හයක් වූ ප්‍රමාණය අනුව ගණන් බලන ලද මුදලක් ද නිවාසයේ කලින් අයිතිකරු විසින් නිවාසයට ගන්නා ලද අමුතු කොටස් කිසිවක් වේ නම් ඒවායේ සහ එහි කරන ලද වැඩිදියුණු කිරීම් කිසිවක් වේ නම් ඒවායේත් සාධාරණ වටිනාකමට සමාන අමතර මුදලක් ද එකතු කළා වූ හා එම කාල පරිච්ඡේදය සඳහා වූ ශුද්ධ ආදායම අඩු කළා වූ එකී 1957 අප්‍රේල් මස 1 වන දින වෙළෙඳ අගය, සහ මිලට ගැනීමෙන් 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව නිවාසයේ අයිතිය ලබා ඇති විට, 1957 අප්‍රේල් මස 1 වන දිනෙන් පසු ලියා අත්සන් කරන ලද එම නිවාසය මිලට ගැනීමේ යම් ඔප්පුවක නිශ්චිතව සඳහන් අඩුම ගැනුම් මිලට, ඒ ඔප්පුවේ දිනයෙහි සිට සතු කරනු ලැබූ දිනය දක්වා වූ එක් එක් වර්ෂය සඳහා ඒ ගැනුම් මිලෙන් සියයට හයක් වූ ප්‍රමාණය අනුව ගණන් බලන ලද මුදලක් ද ඒ ඔප්පුවේ දිනයට පසුව යම් අයිතිකරුවකු විසින් ඒ නිවාසයට ගන්නා ලද අමුතු කොටස් කිසිවක් වේ නම් ඒවායේ සහ එහි කරන ලද වැඩිදියුණු කිරීම් කිසිවක් වේ නම් ඒවායේත් සාධාරණ වටිනාකමට සමාන අමතර මුදලක් ද යන මේවා එකතු කළ විට හා ඒ කාල පරිච්ඡේදය සඳහා වූ ශුද්ධ ආදායම ඉන් අඩු කළ විට එන මුදල ; හෝ

යන මින් අඩු මුදල කුමක් ද ඒ මුදල ද (ආ) ඡේදයෙහි විධිවිධාන අදාළ නොවන අවස්ථාවක (අ) ඡේදයෙහි විධිවිධාන අනුව නිශ්චය කරනු ලබන මුදල ද විය යුතු ය :

එසේ වුව ද—

(i) 14 වන වගන්තිය යටතේ සතු කරන ලද යම් නිවාසයක් සඳහා ගෙවිය යුතු මිල නිශ්චය කිරීමේ දී, ඒ නිවාසය එහි ගෙහිමියාගේ හෝ ඔහුගේ පවුලේ යම් කෙනකුගේ පදිංචිය පිණිස වාසස්ථානයක් වශයෙන් යුක්ති සහගත ලෙස අවශ්‍යව තිබීමේ හේතුව මත එහි කුලී නිවැසියා එයින්

ඉවත් කිරීම සඳහා නඩුවක් හෝ නීති කෘත්‍යයක් පැවරීමේ අයිතිය ඒ නිවාසයේ අයිතිකරුට නොමැති වීම සැලකිල්ලට නොගත යුතු ය ; තව ද

(ii) ගෙපත් ඇති ඉඩමක් සම්බන්ධයෙන් වූ විට ඒ ගෙපත්වලට අනුබද්ධ ඉඩම්වලට වැඩිපුර ඇති යම් ඉඩම් ප්‍රමාණයක් සඳහා ගෙවිය යුතු මිල නිශ්චය කිරීම, කළ හැකි එකම සංවර්ධනය ඒ වැඩිපුර ඉඩම් ප්‍රමාණයේ ද එවැනි ම ගෙපත් ඉදි කිරීම බව පදනම් කොට ගෙන කළ යුතු ය.

මේ වගන්තියේ (ආ) ඡේදයේ කාර්යයන් සඳහා "වර්ෂයක ශුද්ධ ආදායම" යන්නෙන් නියමිත ගෙවල් කුලිය වශයෙන් වර්ෂයකට ලබා ගත හැකි මුදලෙන් ඒ වර්ෂය සඳහා වරිපණම් වශයෙන් ගෙවිය යුතු මුදල අඩු කළ විට ඉතුරු වන මුදල අදහස් වන අතර, 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත අදාළ නොවන නිවාසයක් සම්බන්ධයෙන් වූ විට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල අදහස් වේ.

මුදල් භාරගනු නොලැබූ අවස්ථා ආදිය සඳහා විධිවිධාන සැලැස්වීම.

24. කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක මිල වශයෙන් මෙම පනත යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු යම් මුදලක් ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ විට ඔහු විසින් එය නොපිළිගන්නා ලද අවස්ථාවක සෝ ඒ තැනැත්තා මිය ගොස් ඇති හෝ අභව්‍ය හෝ ඔහු ගැන දැනගන්නට නොමැති අවස්ථාවක, ඒ මුදල එය හිමි තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගැනීම සඳහා යම් දිසා අධිකරණයකට ගෙවිය යුතු ය.

ගෙවිය යුතු මුදලින් මුදල් අඩු කර ගැනීම.

25. මෙම පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක මිල වශයෙන් ගෙවිය යුතු මුදලට යම් තැනැත්තකු හිමිකම් ලැබ සිටින අවස්ථාවක, ආදායම හෝ ලාභ හෝ පුද්ගලික බදු වශයෙන් ඒ තැනැත්තාගෙන් ලැබිය යුතු යයි දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ අත්සන යටතේ කොමසාරිස්වරයාට සහතික කරනු ලැබූ යම් මුදලක් කොමසාරිස්වරයා විසින් එකී මුදලින් දේශීය ආදායම් කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය.

ගෙවිය යුතු මුදල සඳහා වූ පොලිය.

26. මෙම පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක මිල වශයෙන් ගෙවිය යුතු යම් මුදලකින් මෙම පනත යටතේ කරනු ලැබිය හැකි අඩු කිරීම් කිසිවක් අඩු කොට ලැබෙන මුදල සඳහා ඒ මුදල අයත් වී ගෙවිය යුතු වන දින සිට එය ගෙවනු ලබන දිනය තෙක් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කළ හැකි ප්‍රමාණයක් අනුව පොලිය අය විය යුතු ය.

මෙම වගන්තියෙහි ඉහත දැක්වෙන විධිවිධාන යටතේ පොලිය වශයෙන් ගෙවිය යුතු මුදල, ඒ නිවාසය සතු කරනු ලැබූ දිනයෙහි ආරම්භ වන්නා වූ ද ඒ නිවාසයෙහි මිල ගෙවනු ලැබූ දිනයෙහි අවසන් වන්නා වූ ද කාලසීමාව සඳහා ඒ නිවාසය වෙනුවෙන් ගෙවිය යුතු කුලියෙන් වරිපණම් වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් සහ අලුත්වැඩියා කිරීමේ වියදම් වශයෙන් වූ යම් මුදලක් අඩු කොට ලැබෙන මුදලට වැඩි වන අවස්ථාවක, ඒ පොලිය ගෙවනු වෙනුවට අන්තිමට සඳහන් මුදල කොමසාරිස්වරයා විසින් ගෙවිය යුතු ය.

27. මෙම පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක මිල වශයෙන් ගෙවිය යුතු මුදල ඒ නිවාසය සතු කරනු ලැබූ දින සිට අයත් වී අය විය යුතු ලෙස සැලකිය යුතු ය.

ගෙවිය යුතු මුදල ආරම්භ වන දිනය.

28. (1) මෙම පනත යටතේ කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක මිල වශයෙන් ගෙවිය යුතු මුදල, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුපාතයක් අනුව මුදලින් හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ඇපකරවලින් ගෙවිය යුතු ය.

ගෙවීමේ ආකාරය හා ක්‍රමය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන ඇපකර වලට පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය:—

(අ) ඒ ඇපකරය අවුරුදු විසිපහක් වූ කාලයකට විය යුතු අතර සියයට පහක් වූ පොලියක් එයට අයත් විය යුතු ය;

(ආ) කල් පිරීමට පෙර, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව පහත සඳහන් කාර්යයන් සඳහා ඇපකරයන් පවරණය කිරීමට ඒවා දරන්නාට හිමිකම් තිබිය යුතු ය;

(i) නේවාසික ගොඩනැගිලි තැනීම;

(ii) රජයට ලැබිය යුතු කවර ආකාරයක වූ හෝ බදු ගෙවීම;

(iii) සීමාන්තික පෞද්ගලික කරදරවලින් මිදීම; සහ

(iv) මෙම පනත යටතේ නියෝග මගින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් කාර්යයන්.

29. (1) යටත් පිරිසෙයින් හතර දෙනකු අධිකරණමය හෝ නෛතික පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුතු වූ ද යටත් පිරිසෙයින් දෙදෙනකු ඉඩම් තක්සේරු කිරීම පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ඇති (මෙහි මින් මතු "තක්සේරු සාමාජිකවරුන්" යනු වෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් විය යුතු වූ ද, අමාත්‍ය වරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් හත් දෙනකුගෙන් සමන්විත වන සමාලෝචන මණ්ඩලයක් මෙම පනතෙහි කාර්ය යන් සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

සමාලෝචන මණ්ඩලය සංස්ථාපනය කිරීම.

(2) යම් තැනැත්තකු ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු නම් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එබන්දකු වීමට හෝ ඒ තැනැත්තා නුසුදුසු විය යුතු ය.

(3) අධිකරණමය හෝ නෛතික පළපුරුද්ද ඇති මණ්ඩලයේ සාමාජිකයකු සභාපති වශයෙන් ද ඊට සමාන පළපුරුද්ද ඇති වෙනත් සාමාජිකයකු මණ්ඩලයේ උපසභාපති වශයෙන් ද අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) ධුරය කලින් අත්හැරිය හොත් මිස හෝ අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් මිස මණ්ඩලයේ සෑම සාමාජික යකුම තුන් අවුරුදු කාලසීමාවක් ධුරය දැරිය යුතු ය. කාලය ඉකුත් වීමෙන් ධුරය අත්හරින මණ්ඩලයේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු විය යුතු ය.

(5) මණ්ඩලයට (මෙහි මින් මතු "ලේකම්" යනුවෙන් සඳහන් කරනු ලබන) ලේකම් කෙනකු ද මණ්ඩලයේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් හා සේවකයන් ද පත් කරනු ලැබිය යුතු ය.

(6) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්හට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම.

**30.** (1) මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ යොමු කිරීම් සලකා බැලීම හා නිශ්චය කිරීම සඳහා මණ්ඩලයේ සභාපතිගේ හෝ සභාපති නොපැමිණි විටෙක උපසභාපතිගේ විධානය යටතේ ලේකම් විසින් මණ්ඩලයේ රැස්වීම් කැඳවිය යුතු ය.

(2) සභාපති හෝ උපසභාපති සහ එක් කෙනකු තක්සේරු සාමාජිකයකු විය යුතු මණ්ඩලයේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු මණ්ඩලයේ රැස්වීමකට කැඳවනු ලැබිය යුතු ය. ඒ වෙනත් සාමාජිකයන් ලේකම් විසින් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලැබිය යුතු ය.

(3) විවිධ යොමු කිරීම් සලකා බලා නිශ්චය කිරීම පිණිස මණ්ඩලයේ රැස්වීම් දෙකක් වෙන වෙනම කැඳවා එක විටම පැවැත්විය හැකි ය.

(4) මණ්ඩලයේ රැස්වීමකට සභාපති හෝ උපසභාපති කැඳවනු ලබන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි සභාපති හෝ උපසභාපති ඒ රැස්වීමෙහි මූලාසනය දැරිය යුතු අතර ඔහු නොපැමිණෙන විටෙක ඒ රැස්වීම සඳහා කැඳවනු ලැබ එහි පැමිණ සිටින මණ්ඩලයේ සාමාජිකයන් විසින් ඒ රැස්වීම සඳහා සභාපති කෙනකු තමන් අතුරින් තෝරා ගත යුතු ය.

(5) යොමු කිරීමක විෂය වන යම් කරුණකට සම්බන්ධකම් ඇති හෝ එහි ලා සම්බන්ධකම් ඇති යම් තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් ඒ යොමු කිරීම සම්බන්ධයෙන් අධිනීතිඥයකු වශයෙන් හෝ නීතිඥයකු වශයෙන් හෝ වෙන යම් තත්ත්වයක කෙනකු වශයෙන් අදහස් විමසනු ලැබ සිටින මණ්ඩලයේ සාමාජිකයකු ඒ යොමු කිරීම සම්බන්ධයෙන් පැවැත්වෙන මණ්ඩලයේ රැස්වීමක යම් කෘත්‍යයකට සහභාගි නොවිය යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීමක් කල් දැමීම හෝ අඩාලව කල් තැබීම කලින් කල කළ හැකි ය.

මණ්ඩලය ඉදිරියෙහි පැවැත්වෙන කෘත්‍ය.

**31.** (1) සෑම යොමු කිරීමක් ම මණ්ඩලයේ රැස්වීමක දී සලකා බලා නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් එක් එක් යොමු කිරීම සලකා බලා නිශ්චය කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් ලේකම් විසින් නියම කළ යුතු ය.

(3) මණ්ඩලය ඉදිරිපිට පැවැත්වෙන සෑම යොමු කිරීමකට ම අදාළ වන සියලු කෘත්‍යවල වාර්තාවක් ලේකම් විසින් ඒ යොමු කිරීම සම්බන්ධයෙන් තබා ගත යුතු ය.

32. (1) මණ්ඩලයේ සභාපතිට හෝ උපසභාපතිට සහ මණ්ඩලයේ යම් රැස්වීමක දී සභාපති හෝ උපසභාපති මූලාසනය නොගත්තේ නම්, ඒ රැස්වීමේ සභාපතිට, යම් යොමු කිරීමක් ගැන සලකා බැලීමේ හා තීරණය කිරීමේ කාර්යයෙන් සඳහා— සාක්ෂිකරුවන් කැඳවීම ආදිය සඳහා බලය.

(අ) සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණෙන ලෙස ඔවුන්ට බල කිරීමට ;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීමට ; සහ

(ඇ) සාක්ෂිකරුවන් දිවුරවීමට හෝ ඔවුන් ලවා ප්‍රතිඥාවක් කර වීමට

දිසා අධිකරණයකට ඇති සියලු බලතල තිබිය යුතු ය.

(2) සාක්ෂිකරුවකු වශයෙන් මණ්ඩලයේ රැස්වීමකට පැමිණ සිටින සෑම තැනැත්තකුට ම මණ්ඩලයේ සභාපති විසින් හෝ සභාපති නොමැති විට උපසභාපති විසින් නිශ්චය කරනු ලැබිය යුතු මුදලක් ගමන් වියදම් හා වෙනත් වියදම් වශයෙන් ගෙවිය යුතු ය.

33. මණ්ඩලයේ රැස්වීමක දී යම් කරුණක් සම්බන්ධයෙන් සාක්ෂි දෙන සෑම තැනැත්තකු ම එම කරුණ සම්බන්ධයෙන් සත්‍යය ප්‍රකාශ කිරීමට බැඳී සිටිය යුතු ය. සාක්ෂි දෙන තැනැත්තන් සත්‍යය ප්‍රකාශ කිරීමට බැඳී සිටින බව.

34. (1) මණ්ඩලයේ රැස්වීමකදී සලකා බලනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන් ඒ රැස්වීමේදී කරනු ලබන නිශ්චය ඒ කරුණ සම්බන්ධයෙන් මණ්ඩලයේ නිශ්චය ලෙස සැලකිය යුතු ය. මණ්ඩලයේ නිශ්චය.

(2) යම් කරුණක් සලකා බලන මණ්ඩලයෙහි සාමාජිකයන් ඒ කරුණ සම්බන්ධයෙන් කරන නිශ්චය ගැන එකඟ නොවන අවස්ථාවක, ඔවුන්ගෙන් වැඩි දෙනාගේ නිශ්චය ඒ කරුණ සම්බන්ධයෙන් මණ්ඩලයෙහි නිශ්චය විය යුතු අතර, සාමාජිකයන් තම මතයෙහි දී සම සම ව බෙදී ගිය අවස්ථාවක, ඒ කරුණ සලකා බලනු ලබන රැස්වීමේ සභාපතිගේ කැමැත්ත ලැබෙන නිශ්චය ඒ කරුණ සම්බන්ධයෙන් මණ්ඩලයෙහි නිශ්චය විය යුතු ය.

(3) මණ්ඩලයේ සෑම නිශ්චයක ම ඊට හේතු අඩංගු විය යුතු ය.

35. කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් මෙම පනතෙහි විධිවිධාන වලට යටත්ව, මණ්ඩලයෙහි රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් නියම කළ හැකි ය. මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පරිපාටිය විධිමත් කළ හැකි බව.

36. මිල පිළිබඳ තීන්දුවක් සඳහා වූ යොමු කිරීමක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, කොමසාරිස්වරයාට ද ඒ යොමු කිරීම ඉදිරිපත් කරන ලද්දේ යම් නිවාසයක් පිළිබඳව නම් ඒ නිවාසය මිලට ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති යම් කුලී නිවැසියකුට ද නිවාසයෙහි මිල වශයෙන් ගෙවිය යුතු සම්පූර්ණ මුදලට හෝ ඉන් කොටසකට හිමිකම් කියා ඇති සෑම තැනැත්තකුට ද පෞද්ගලිකව ම හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ අනුයෝජිතයකු මාර්ගයෙන් හෝ කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක්, ඒ තීන්දුව දීමට පෙර, මණ්ඩලය විසින් ලබා දිය යුතු ය. කරුණු ඉදිරිපත් කිරීමේඅවස්ථාවක් කොමසාරිස් වරයාට, කුලී නිවැසියන්ට සහ හිමිකම් පාන්නන්ට දිය යුතු බව.

සාක්ෂි පිළිබඳ විධිවිධාන.

**37.** කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක තත්ත්වය පිළිබඳව කොමසාරිස්වරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ පිළියෙල කරනු ලැබූ යම් වාර්තාවක පිටපතක් තිබෙන අවස්ථාවක, ඒ නිවාසයෙහි මිල තීරණය කිරීමට අදාළ ව මණ්ඩලය ඉදිරියෙහි පැවැත්වෙන යම් කෘත්‍යයක දී පටහැනි තත්ත්වයක් ඔප්පු කරනු ලබන තෙක් ඒ වාර්තාව එහි ලා සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂ්‍ය විය යුතු ය.

යොමු කිරීමක දී මණ්ඩලය විසින් තීන්දුවක් දිය යුතු බව.

**38.** (1) කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක් සම්බන්ධයෙන් මිල පිළිබඳ තීන්දුවක් සඳහා වූ යොමු කිරීමක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු කරුණු සලකා බැලීමෙන් පසු සහ සියලු සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමෙන් පසු මණ්ඩලය විසින්,—

(අ) හිමිකම් පෑමක් කර ඇති එක් එක් තැනැත්තා ඊට හිමිකම් ඇති තැනැත්තකු ද නැද්ද යන වග, සහ එසේ නම් ඔහු ට එසේ හිමිකම් ඇත්තේ කිනම් තත්ත්වයකින් ද යන වග ;

(ආ) ඒ නිවාසය පිළිබඳ මිල වශයෙන් මෙම පනතෙහි විධිවිධාන අනුව ගෙවිය යුතු මුදල ; සහ

(ඇ) ඒ මුදලට හිමිකම් ඇති තැනැත්තන් අතර එය කොටස් කර බෙදා දීම

නිශ්චය කරමින් තීන්දුවක් දිය යුතු ය :

එසේ වුව ද ඒ මුදලට හිමිකම් ඇති තැනැත්තන් සම්බන්ධයෙන් හෝ ඒ මුදලට හිමිකම් ඇති තැනැත්තන් අතර එය කොටස් කර බෙදීම සම්බන්ධයෙන් ආරාවුලක් ඇති වන අවස්ථාවක, මණ්ඩලය විසින් තීන්දුවක් දීම කල් තබා ඒ නිවාසය පිහිටා ඇත්තේ යම් දිසා අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ දිසා අධිකරණය වෙත එම ආරාවුල තීරණය කිරීම සඳහා යොමු කළ යුතු අතර, ඒ ආරාවුල සම්බන්ධයෙන් ඒ අධිකරණය සවකීය තීරණය කළ පසු ඒ තීරණය අනුව මණ්ඩලය විසින් තීන්දුවක් දිය යුතු ය.

(2) කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ යම් නිවාසයක් සම්බන්ධයෙන් ඒ මුදලට කිසිම තැනැත්තකු හිමිකම් පෑමක් ඉදිරිපත් නො කරන අවස්ථාවක, (1) වන උපවගන්තියෙහි (අ) හා (ඇ) ඡේදවල නිශ්චිතව සඳහන් කරුණු මෙම වගන්තිය යටතේ වූ තීන්දුවෙහි නිශ්චය කිරීමත් ඒ මුදලට හිමිකම් පාන්නන්හට තීන්දුව පිළිබඳ දැන්වීමක් නිකුත් කිරීමට අදාළව (3) වන උපවගන්තියෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීමත් අවශ්‍ය නොවිය යුතු ය.

(3) මණ්ඩලයේ තීන්දුව පිළිබඳ ලිඛිත දැන්වීමක් කොමසාරිස්වරයාට සහ ඒ මුදලට හිමිකම්පාන්නන්හට දෙනු ලැබීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(4) මණ්ඩලයේ තීන්දුවක් අවසානාත්මක විය යුතු අතර කිසියම් අධිකරණයක දී එය ප්‍රශ්න නොකළ යුතු ය.

**39.** (1) මෙම පනත යටතේ කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ යම් තීරණයකින් හෝ නිශ්චයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් තමා වෙත ඒ තීරණය හෝ නිශ්චය දැනුම් දෙනු ලැබූ දින සිට එක් මාසයක් ඇතුළත ඒ තීරණයට හෝ නිශ්චයට විරුද්ධව හේතු ප්‍රකාශ කරමින් මණ්ඩලය වෙත අභියාචනා කළ හැකි ය.

කොමසාරිස් වරයාගේ තීරණවලට විරුද්ධව අභියාචනා කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ යම් අභියාචන යක් විභාග කිරීමට හා තීරණය කිරීමට 30 සිට 36 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ යම් අභියාචන යක දී මණ්ඩලයෙහි තීරණය අවසානාත්මක විය යුතු අතර යම් අධිකරණයක දී එය ප්‍රශ්න නොකළ යුතු ය.

## II වන කොටස

### නිවාස තැනීම විධිමත් කිරීම

**40.** පිට බිත්තිවල ඝනකම ඇතුළත්ව බිම් ප්‍රමාණය වර්ග අඩි දෙදහසකට වැඩි වන නිවාසයක් තැනීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය:

නිවාසවල බිම ප්‍රමාණය සීමා කිරීම.

එසේ වුව ද ඉහත සඳහන් බිම් ප්‍රමාණයට වැඩි වන ශිෂ්‍ය නිවාස හා බැරැක්ක වැනි පොදු වාසස්ථාන තැනීම උචිත බලධරයාගේ පූර්ව අවසරය ලියවිල්ලකින් ලබා ගෙන යම් තැනැත්තකු විසින් කළ හැකි ය.

**41.** නිවාසයකට අනුබද්ධ ඉඩම සමග මහා නගර සභා ප්‍රදේශ යන්හි පර්චස් විස්සකටත් නගර සභා ප්‍රදේශයන්හි පර්චස් හතළිහකටත් වැඩි වන බිම් කොටසක නිවාසයක් තැනීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය:

නිවාස තැනිය හැකි උපරිම ඉඩම ප්‍රමාණය.

එසේ වුව ද මෙම වගන්තියෙහි ඉහත දැක්වෙන විධිවිධානවල නිශ්චිත ව සඳහන් ප්‍රමාණයට වැඩි වූ බිම් ප්‍රමාණයක් උචිත බලධර යාගේ මතය අනුව තවත් නිවාසයක් තැනීම කළ නො හැකි බිම් ප්‍රමාණයක් වන අවස්ථාවක එසේ වැඩිවීම මෙම වගන්තියෙහි විධිවිධාන කඩකිරීමක් නොවිය යුතු ය:

එසේම තවදුරටත්, තට්ටු නිවාස දෙකක් හෝ වැඩි ගණනක් තැනීමේදී ඒ තට්ටු නිවාසවලට අනුබද්ධ ඉඩම් ප්‍රමාණය උචිත බලධරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණය විය යුතු ය.

**42.** බිම් ප්‍රමාණයේ වර්ග අඩියකට වියදම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කළ හැකි මුදලට වැඩි වන නිවාසයක් යම් තැනැත්තකු විසින් තනනු ලබන අවස්ථාවක, ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත් වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ නිවාසය තැනීමේ වියදම අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ මුදල අනුව නිශ්චය කරනු ලබන තැනීමේ වියදමට වැඩි වන ප්‍රමාණය මෙන් තුන් ගුණයකට නොඅඩු දඩයකට ඔහු යටත් විය යුතු ය.

නිවාස තැනීමේ වියදම සීමා කිරීම.

මෙම පනත ආරම්භ වීමට පෙර තැනීම ආරම්භ වූ නිවාස වලට මෙම කොට සෙහි විධිවිධාන අදාළ නොවිය යුතු බව.

43. මෙම පනත ආරම්භ වීමේ දිනයට පෙර තැනීම ආරම්භ වූ යම් නිවාසයකට මෙම කොටසෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

## III වන කොටස

## සාමාන්‍ය කරුණු

නියෝග.

44. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ ප්‍රතිපත්ති බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරෙන බලතලවල ව්‍යාප්ති යට හානියක් නොවන පරිදි, නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත හෝ සියලු කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් ද නියෝග පැනවීමට නියමිත හෝ බලය පැවරී ඇති හෝ සියලු කරුණු සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මනින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතියේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. එසේ අනුමත කරනු ලැබූ සෑම නියෝගයක් ම මෙහිලා පනවන ලද්දාක් මෙන් වලංගු හා බලසහිත විය යුතු ය.

වැරදි.

45. (1) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ යම් විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) 42 වන වගන්තිය යටතේ වූ වරදක් නොවන මේ පනත යටතේ වූ වරදක් කරන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ වරදක් කරන තැනැත්තකු සමාගමක් හෝ සංස්ථාවක් හෝ (සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද) යම් පුද්ගල සංගමයක් නැතහොත් ව්‍යාපාරික ආයතනයක් වන අවස්ථාවක, එහි සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු, අනුයෝජිතයකු හෝ එහි පාලනය හා සම්බන්ධ වෙනත් සෑම නිලධරයකු හෝ තැනැත්තකු සහ ව්‍යාපාරික ආයතනයේ සෑම

හවුල්කරුවකු, ඒ වරද තමාගේ දැනීම හෝ කැමැත්ත නොමැතිව කරනු ලැබූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුව හොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිභවා බල පැවැත්විය යුතු බව.

**46.** වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ වෙනත් නීතිය හා අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් ඇති වුව හොත් මේ පනතේ විධිවිධාන ඒ වෙනත් නීතිය අභිභවා බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**47.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි—

"උචිත බලධරයා" යන්නෙන්, යම් නිවාසයක්—

(අ) මහා නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක සීමා තුළ පිහිටා ඇති විට හෝ තනනු ලැබීමට ඇති විට අවස්ථාවෝචිත පරිදි ඒ මහා නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නගර සභාවේ සභාපතිවරයා හෝ සුළු නගර සභාවේ සභාපතිවරයා ;

(ආ) යම් ගම් සභාවක පරිපාලන සීමා තුළ පිහිටා ඇති විට හෝ තනනු ලැබීමට ඇති විට ඒ පරිපාලන සීමා පිහිටා ඇති පරිපාලන කොට්ඨාශයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා හෝ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ආඥාවක් මගින් නියම කළ හොත් ඒ ගම් සභාවේ සභාපතිවරයා ; හෝ

(ඇ) ඉහත කී සීමාවලින් පිටත යම් ස්ථානයක පිහිටා ඇති විට හෝ තනනු ලැබීමට ඇති විට ඒ ස්ථානය පිහිටා ඇති පරිපාලන කොට්ඨාශයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා

අදහස් වේ ;

"කොමසාරිස්වරයා" යන්නෙන් ජාතික නිවාස කොමසාරිස්වරයා අදහස් වේ ;

"ගෙපත" යන්නෙන් වෙන වෙනම කුලියට දී ඇත්තා වූ ද වෙන වෙනම වරිපණම් අංක ඇත්තා වූ ද එක් එක් නිවාසයට වැසිකිළි, නාන ස්ථාන, කුස්සි හෝ ආලින්ද යන මින් කිසිවක් පොදුවේ ඇති වාසය කරන ගෙවල් දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත ගොඩනැගිල්ලක් අදහස් වේ ;

"තට්ටු නිවාසය" යන්නෙන් තට්ටු එකකට වඩා ඇති ගොඩනැගිල්ලක අංග පූර්ණ ගෘහ කාමර පංතියක් අදහස් වේ ;

"තැනැත්තා" යන්නට සංස්ථා ගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ;

"නගර සභා ප්‍රදේශය" යන්නෙන් නගර සභාවක පරිපාලන සීමා තුළ පිහිටි ප්‍රදේශයක් අදහස් වේ ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

"නිවාසය" යන්නෙන් බදු අය කිරීම සඳහා තක්සේරු කර ඇතත් නැතත් හුදෙක් හෝ ප්‍රධාන වශයෙන් වාසය සඳහා තනා ඇත්තා වූ ද වෙනම ප්‍රවේශ දොරටුවක් ඇත්තා වූ ද ඔස්සේ ගොස් වාසය සඳහා පාවිච්චි කෙරෙන වෙනත් ස්ථානයකට ප්‍රවේශ විය නොහැක්කා වූ ද නිවාස ඒකකයක් අදහස් වන අතර තට්ටු නිවාසයක් හෝ ගෙපතක් ඊට ඇතුළත් වේ. එහෙත්—

(1) වාසය සඳහා වූ තනි ඒකකයක් ලෙස මුල දී පාවිච්චි කරන ලද නිවාසයක් කොටස් කිරීමෙන් ඇති වූ අනුකොටස් හෝ ඒ නිවාසයට එකතු කරන ලද අමුතු කොටස් ; සහ

(2) 1972 මාර්තු මස 1 වන දිනට පෙරාතුව වූ අවුරුදු දහයේ අඛණ්ඩ කාල සීමාව තුළ වාසය කිරීමේ කාර්යයක් නොවන වෙනත් කාර්යයක් සඳහා හුදෙක්ම හෝ ප්‍රධාන වශයෙන් පාවිච්චි කරන ලද නිවාසයක්

ඊට ඇතුළත් නොවේ;

"ප්‍රසිද්ධ සමාගම" යන්නෙන්—

(අ) සමාගම් ආඥාපනත යටතේ ප්‍රසිද්ධ සමාගමක් වශයෙන් ලියාපදිංචි කරන ලද සමාගමක් ; හෝ

(ආ) සමාගම් ආඥාපනතේ XI වන කොටස අදාළ වන්නා වූ සමාගමක්

අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ;

"මහා නගර සභා ප්‍රදේශය" යන්නෙන් මහා නගර සභාවක පරිපාලන සීමා තුළ පිහිටි ප්‍රදේශයක් අදහස් වේ;

"යැපෙන දරුවා" යන්නෙන්, යම් පුද්ගලයකු සම්බන්ධයෙන් එය යෙදුණු විට, වයස අවුරුදු දහඅටට අඩු—

(අ) විවාහක දරුවකු නොවන, හා

(ආ) දෙමව්පියන් විසින් නඩත්තු කරනු නොලබන්නා වූ ද වෙනම ජීවනෝපායක් ඇත්තා වූ ද දරුවකු නොවන

දරුවකු අදහස් වන අතර,

(i) ඒ පුද්ගලයාගේ හෝ ඒ පුද්ගලයාගේ භාර්යාවගේ හෝ ස්වාමිපුරුෂයාගේ සුළු දරුවෙක්,

(ii) හැසිරීමෙන් සහ ප්‍රසිද්ධියෙන් ඇති වූ විවාහයකින් හෝ චාරිත්‍රානුකූල වූ විවාහයකින් ඉපැදුණු, ඒ පුද්ගලයාගේ දරුවෙක්,

(iii) දරුකමට හදාගැනීමේ ආඥාපනත යටතේ කරන ලද දරුකමට හදාගැනීමේ යම් ආඥාවකින් ඒ පුද්ගලයාට දරුකමට හදාගැනීමට බලය දෙනු ලැබූ දරුවෙක්,

(iv) ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන විට ඔහු පුරවැසියකු හෝ යටත් වැසියකු වන රටෙහි නීතියට අනුකූලව ඔහු විසින් දරුකමට හදා ගන්නා ලද දරුවකු ඔහුට සිටින බවට ඔහු කොමසාරිස්වරයා සෑහීමට පත් කරන්නා වූ අවස්ථාවක, ඒ දරුවා, සහ

(v) දරුවා හෝ සුළු දරුවා හෝ වයස අවුරුදු දහ අටට අඩු නොවන්නේ නම් සහ, ඒ පුද්ගලයා සමග වාසය කරන්නේ නම් සහ ඔහු විසින් නඩත්තු කරනු ලබන්නේ නම් හෝ ඔහු විසින් යම් සුබාගාරයක, රක්ෂස්ථානයක හෝ අධ්‍යාපනික ආයතනයක නඩත්තු කරනු ලබන්නේ නම්, ඒ දරුවා හෝ සුළු දරුවා

ඊට ඇතුළත් වේ. එහෙත් (iii) වන ඡේදයේ හෝ (iv) වන ඡේදයේ සඳහන් හදාගත් දරුවකු නොවන අන් කිසි හදාගත් දරුවෙක් මීට ඇතුළත් නොවේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් ප්‍රදාන හෝ ණය හෝ වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධන යෙන්, සමාගම් ආඥාපනත නොවන යම් ලිඛිත නීතිය කින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

## උපලේඛනය

**විස්තර** — **8 වන වගන්තිය**

1. අයිතිකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය:
2. ප්‍රකාශනය කරන්නේ අයිතිකරු නොවේ නම් ප්‍රකාශකගේ නම සහ ලිපිනය:
3. නිවාසයේ පිහිටීම:
   ඉඩමේ නම, වරිපණම අංකය, වීදියේ, කොට්ඨාශයේ සහ නගරයේ/ගමේ නම සඳහන් කරන්න:
4. සම්පූර්ණයෙන් අයිතිව තිබේද යන වග:
   කොටස් වශයෙන් අයිති නම් නිවාසයෙන් අයිතිකරුට ඇති කොටස සඳහන් කරන්න.
5. අයිතිය පිළිබඳ විස්තර—
   (අ) මිලට ගැනීමෙන් නම්—
   ඔප්පු අංකය, නොතාරිස්ගේ නම, ලියා සහතික කළ දිනය, ඉඩමේ ප්‍රමාණය සහ ඔප්පුවේ දැක්වෙන මිල සඳහන් කරන්න.
   (ආ) මිලට ගැනීමෙන් හැර වෙනත් ආකාරයකින් නම්—
   අයිතිය ලැබුණු ආකාරය, එනම් තෑග්ගක් වශයෙන් ද උරුමයෙන් ද යන වග සඳහන් කරන්න. (අ) යටතේ මෙන් විස්තර සපයන්න.

6. අනුබද්ධ ඉඩම් ප්‍රමාණය :

(මිනින්දෝරු ප්ලෑනේ හෝ දිග පළල දැක්වෙන රේඛා චිත්‍ර කටු සටහනක පිටපතක් අමුණන්න.)

7. (අ) නිවාසය තනන ලද්දේ අයිතිකරු විසින් දැයි සඳහන් කරන්න :

(ආ) මිලට ගැනීමෙන් පසු වෙනස් කිරීම් හෝ වැඩිදියුණු කිරීම් කරන ලද දැයි සඳහන් කරන්න. ඒවායේ විස්තර දෙන්න.

8. උකස්කර, බදුකර ආදී වශයෙන් වූ සියලු බැඳීම් පිළිබඳ විස්තර දෙන්න :

9. කුලී නිවැසියාගේ නම සහ ලිපිනය :

10. දැනට සිටින කුලී නිවැසියාගේ නිවාස බද්ද ආරම්භ වූ දිනය සඳහන් කරන්න :

11. නිවාසයේ සම්මත කුලිය සහ නියමිත කුලිය සඳහන් කරන්න :

12. අය කරනු ලබන කුලිය සඳහන් කරන්න :

13. නිවාසයේ අයිතිය මේ පනත යටතේ තවදුරටත් තබාගැනීමට අදහස් කරන්නේ දැයි සඳහන් කරන්න :